(4)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ පාර්ලිමේන්තුව

# 1994 අංක 22 දරන
# වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ
# නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට
# එරෙහිව වූ සම්මුතිය පනත

(සහතිකය සටහන් කළේ දෙසැම්බර් මස 20 වන දින.)

කොළඹ විශ්වවිද්‍යාලයීය
මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය මගින් පළ කැරිණි

# 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත

(සහතිකය සටහන් කළේ 1994 දෙසැම්බර් මස 20 වන දින)

එල්. ඩී. - ඕ. 8/94

**වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුතිය බල ගැන්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා වූ පනතකි.**

වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතියක් 1984 දෙසැම්බර් මස 10 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද හෙයින් ද;

1994 ජනවාරි මස 3 වන දිනැති වූ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා ලේකම්වරයා වෙත 1993 දෙසැම්බර් මස 29 වන දින තැන්පත් කරන ලද්දා වූ ද එකඟවීමේ සාධන පත්‍රයක් මගින් ශ්‍රී ලංකාවට ඉහත කී සම්මුතිය පිළිගෙන ඇති හෙයින්ද;

ඉහත කී සම්මුතිය ශ්‍රී ලංකාවට අදාළව 1994 පෙබරවාරි මස 2 වන දින සිට බලාත්මකවීම ආරම්භ වී ඇති හෙයින් ද;

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාමය විධිවිධාන පැනවීමට අවශ්‍යව ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය 1. මේ පනත 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකිමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වධදීම වරදක් වන බව 2. (1) වෙනත් යම් තැනැත්තකුට වධදෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ වරදක්-

(අ) සිදු කිරීමට තැත් කරන;
(ආ) සිදු කිරීමට ආධාර හා අනුබල දෙන;
(ඇ) සිදු කිරීමට කුමන්ත්‍රණය කරන;

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) ලිඛිත නීතිය මගින් පිළිගත් කවර හෝ ස්වරූපයක දඬුවමකට නිසි බලය ඇති අධිකරණයක ආඥාව අනුව යම් තැනැත්තකු යටත් කිරීම (1) වන උපවගන්තිය යටතේ වරදක් වන ලෙස නොසැලකිය යුතු ය.

(4) මේ පනත යටතේ වරදකට වරදකරු වන තැනැත්තකු මහාධිකරණය විසින් නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(5) මේ පනත යටතේ වූ වරදක් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥේය වරදක් සහ ඇපදිය නොහැකි වරදක් විය යුතු ය.

3. මේ පනත යටතේ වරදක් සංයුක්ත කරන යම් ක්‍රියාවක් -

යුද්ධමය තත්වයක් යනාදිය පවත්නා විට හෝ උසස් නිලධරයකුගේ නියමයක් මත හෝ කරන ලද යම් ක්‍රියා මේ පනත යටතේ වරදක් සම්බන්ධව චිත්ති වාචකයක් නොවන බව.

(අ) යුද්ධමය තත්ත්වයක්, යුද්ධමය තර්ජනයක්, අභ්‍යන්තර දේශපාලන අස්ථාවරතාවක් හෝ මහජන හදිසි අවස්ථාවක් පවත්නා අවස්ථාවක;

(ආ) උසස් නිලධරයකුගේ හෝ රාජ්‍ය අධිකාරියක නියමයක් මත සිදු කරන ලදැයි යන කරුණ, ඒ වරද සිදුකිරීම සම්බන්ධයෙන් චිත්තිවාචකයක් නොවිය යුතු යැයි, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

4. (1) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුව ද නොවුව ද ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දේශයෙන් පිටත යම් ස්ථානයක දී සිදු කරන ලද මේ පනත යටතේ වූ වරදක් -

ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද මේ පනත යටතේ වූ වැරදි විභාග කිරීමට මහාධිකරණයට බලය ඇති බව

(අ) වරදකරු ශ්‍රී ලංකාවෙහි සිටින හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද නැවක හෝ ගුවන් යානයක සිටින;

(ආ) වරදක් සිදු කරන ලදැයි කියනු ලබන තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන; හෝ

(ඇ) වරද සිදු කරන ලදැයි කියනු ලබන්නේ යම් තැනැත්තකුට අදාළව ද ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් විභාග කිරීමට හා නඩු විභාග කිරීමට ශ්‍රී ලංකාවේ මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ දේශයෙන් පිටත සිදු කරන ලද මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහාධිකරණයේ අධිකරණ බලය අග්‍රවිනිශ්චයකාරවරයාගේ අත්සන යටතේ ලියවිල්ලක මගින් අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන අධිකරණ කලාපයේ පවත්වනු ලබන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සාක්ෂි

5. යම් අපරාධ නඩු කටයුත්තක දී, වෙනත් අවස්ථාවල දී ආවේශ්‍ය නොවන පාපොච්චාරණයක්, මේ පනත යටතේ පවරන ලද නඩු කටයුතුවල දී, එම පාපොච්චාරණය කිරීමේ කරුණ ඔප්පු කිරීමේ කාර්යය සඳහා පමණක් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ සිරභාරයට ගනු ලැබූ ඇතැම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්

6. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට සිරභාරයට ගත් අවස්ථාවක, ඔහු පුරවැසියකු වන රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමග ද හෝ එකී තැනැත්තා රාජ්‍යයකට අයත් නොවන තැනැත්තකු නම් ඔහු සාමාන්‍යයෙන් පදිංචිව සිටින රාජ්‍යයේ, ළඟම සිටින උචිත නියෝජිතයා සමග නොපමාව ම සන්නිවේදන සිදු කිරීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

වරදක් පිළිබඳව අධිකරණ බලය ඇති අනෙකුත් රාජ්‍යවලට දැනුම් දීමට අමාත්‍යවරයාට ඇති යුතුකම

7. (1) මේ පනත යටතේ වූ වරදකට යම් තැනැත්තකු සිරභාරයට ගත් අවස්ථාවක, එම වරද සඳහා ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට හෝ ඒ තැනැත්තා උදර්පණය කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගත් හෝ ගැනීමට යෝජනා කරන පියවර ගැන, එම වරද පිළිබඳ ව අධිකරණ බලය ඇති වෙනත් යම් රාජ්‍යයක අදාළ බලධාරීන්ට, විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් දැන්විය යුතු ය.

(2) වධදීමේ වරදට චෝදනා කරනු ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උදර්පණය කිරීම සඳහා යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන්, එම වරද සම්බන්ධයෙන් එම තැනැත්තාට නඩු පැවරීමට හෝ එම තැනැත්තා උදර්පණය කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජනා කරනු ලබන පියවර පිළිබඳව, ඉල්ලුම් කරන රාජ්‍යයේ ආණ්ඩුවට නොපමාව ම දැනුම් දිය යුතු ය.

(3) වධදීමේ වූදිත හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත යටතේ උදර්පණය කිරීම සඳහා යම් රාජ්‍යයක ආණ්ඩුව විසින් කරන ලද ඉල්ලීමක් අනුව ඒ තැනැත්තා ඒ පනත යටතේ උදර්පණය කිරීම සඳහා ආඥාවක් නොකළ යුතු බවට තීරණය කරන ලද අවස්ථාවක, ඒ තැනැත්තා චෝදනා ලැබූ වරද සඳහා ඔහුට විරුද්ධව නඩු පැවරිය හැකි වීම හෝ වෙනත් සුදුසු පියවරක් ගැන සලකා බැලිය හැකි වීම සඳහා එම කාරණය අදාළ බලධාරීන්ට ඉදිරිපත් කළ යුතු ය.

8. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත, මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත සංශෝධනය කිරීම

9. (1) ශ්‍රී ලංකා ආණ්ඩුව හා වෙනත් යම් රාජ්‍යයක ආණ්ඩුව අතර උදර්පණ වැඩ පිළිවෙලක් බලාත්මකව ඇති අවස්ථාවක දී, එම වැඩ පිළිවෙලට ජාතික රාජ්‍යය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්ය සඳහා

උදර්පණ වැඩ පිළිවෙලවල් පිළිබඳ විධිවිධාන

සම්මුතියේ අර්ථකථනය කර ඇති පරිදි වූ වධදීමේ වරද සහ එම වරද සිදු කිරීමට තැත් කිරීමේ, එම වරද සිදු කිරීමට ආධාර හා අනුබලදීමේ හෝ එම වරද සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීමේ වරද සම්බන්ධයෙන් උදර්පණය සඳහා වූ විධිවිධාන ඇතුළත් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ආණ්ඩුව සහ යම් රාජ්‍යයක් අතර ඇති කර ගත් උදර්පණ වැඩ පිළිවෙලක් බලාත්මකව නොපවතින අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්ය සඳහා සම්මුතිය, සම්මුතියේ අර්ථකථනය කර ඇති පරිදි වූ වධදීමේ වරද සහ එම වරද සිදු කිරීමට තැත් කිරීමේ, එම වරද සිදු කිරීමට ආධාර හා අනුබලදීමේ හෝ එම වරද සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීමේ වරද සම්බන්ධයෙන් උදර්පණය සඳහා වූ විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එම රාජ්‍යයේ ආණ්ඩුව සමග ඇති කර ගන්නා ලද උදර්පණ වැඩ පිළිවෙලක් වශයෙන් සැලකිය හැකි ය.

අනිකුත් රාජ්‍යවලට උදව් කිරීමට ආණ්ඩුවේ යුතුකම.

10. වධදීමේ වරද සම්බන්ධයෙන් යම් රාජ්‍යයක යම් තැනැත්තකුට විරුද්ධව පවරන ලද අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වන (ආණ්ඩුව සතුව ඇති යම් අදාළ සාක්ෂි සැපයීම ඇතුළුව) ආධාර එම රාජ්‍යයේ අදාළ බලධාරීන්ට ආණ්ඩුව විසින් දිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

12. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

අර්ථ නිරූපණය

"සම්මුතිය" යන්නෙන් 1984 දෙසැම්බර් මස 10 වන දින නිව්යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකිම්වලට එරෙහිව වූ සම්මුතිය අදහස් වේ;

"රජයේ නිලධරයා" යන්නෙන් ජනරජය යටතේ යම් ගෙවීමක් ලබන තනතුරක් දරන තැනැත්තෙක් අදහස් වේ;

"වධදීම" යන්නෙහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ සජාතිය යෙදුම් ඇතුළුව, "වධදීම" යන්නෙන් වෙනත් යම් තැනැත්තකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූ ද-

(අ) පහත දැක්වෙන කාර්යයන් සඳහා,

එනම් :-

i. එකී වෙනත් තැනැත්තාගෙන් හෝ තුන්වන තැනැත්තකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබා ගැනීම; හෝ

ii. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූ ද;

iii. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා;

(ආ) වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නා වූ ද;

සෑම අවස්ථාවක දී ම රජයේ නිලධරයකු හෝ නිල තත්ත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තකු විසින් හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ මුල්වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නා වූ ද යම් ක්‍රියාවක් අදහස් වේ.

**උපලේඛනය** (7 වන වගන්තිය)

**ජාතික රාජ්‍යය සභාවේ 1977 අංක 8 දරන උද්පණ පනත සංශෝධනය කිරීම.**

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්පණ පනතේ උපලේඛනය. එම 'බී' කොටසට පෙරාතුවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.-

"(39) වධදීම"